**රත්තොට ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

රත්තොට ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රත්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු. 86,687 ක පුස්තකාල පොත් ප්‍රාග්ධන ආදායම් හා ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා කඩකුලී බිල් කළ ආදායම රු.4,363,800 ක් වුවද එය රු.4,609,027 ක් ලෙස රු.245,227 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | අදාළ මුදල ජ'නල් සටහන් මඟින් නිවැරදි කරන බව. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 06 කට අදාල ශේෂයන් හා ඒවාට අදාල උපලේඛණවල ශේෂයන් සමඟ සැසඳීමේදී රු. 13,725,421 ක වෙනසක් පැවතුණි. | අදාළ වෙනස සොයා ගැනීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළයුතුය . |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 24 කට අධික කාලයක සිට පැවත එන රු.15,462 ක අවිනිශ්චිත ගිණුම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශේෂය කපා හැරීම සඳහා විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමුකර ඇති බව. | ගිණුම් ශේෂ නිවැරදි කළයුතුය . |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.827,314 ක වත්කම් විෂයයන් 08 ක් හා එකතුව රු.17,664,535 ක බැරකම් විෂයයන් 07 කට අදාල ස්ථාවර වත්කම් ලේඛනය, ශේෂ සනාථ කිරීමේ ලිපි, ලිපිගොනු හා උපලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ශේෂය කපා හැරීම සඳහා විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමුකර ඇති බව. | ගිණුම් ශේෂයන්ට අදාල ලේඛන/උප ලේඛන හා ලිපි ගොනු පිළියෙල කල යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1) xii වගන්තිය | අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව රත්තොට ලෝන්විල් වත්ත නැමැති ඉඩම, රාජ්‍ය බැංකුවක් සඳහා ඉදිරි වසර 30 ක කාලයකට බදු දී තිබුණි. | තක්සේරු වාර්තාවක් ලබා ගෙන විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන ගිවිසුම්ගත වීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | රීති 59 | බලපත්‍ර ලබාගත යුතු ආයතන සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා රීති 60 හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳ ලැයිස්තුවක් සකස් කළයුතු වුවත්, එවැනි සමීක්ෂණයක් සිදුකර ලැයිස්තුවක් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා විධිමත් බලපත්‍ර සමීක්ෂණයක් සිදුකර බලපත්‍ර සමීක්ෂණ වාර්තාව සකස් කර ඇති බව. | රීති ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) | රීති 218 | ඉඩම් හා ගොඩනැඟිලි සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | සමීක්ෂණයක් සිදුකරමින් පවතින බව. | රීති ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මු රෙ 571(2) | 2019 හා 2020 වර්ෂවලට අදාල රු.295,452 ක කර්මාන්ත අතුරුදවුම් නියාදනය කර නොතිබුණි. | නිරවුල් කිරිමට ඉදිරියේදි කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය . |
| (ඈ) | 2018 අප්‍රේල් දින රහිත අංක මප /ප.පා. කො. චක්‍රලේඛ අංක 2018/05 දරන මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව දෛනික පදනම මත (මාස 3 පදනම) බඳවාගත් සෞඛ්‍ය කම්කරුවෙකු හා ජල කම්කරුවෙකු සඳහා 2020 ඔක්තෝබර් මස සිට 2022 දෙසැම්බර් දක්වා රු.,808,498 ක වැටුප් ගෙවා තිබුණි. | පළාත්පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය සඳහා ලිපි ඉදිරිපත් කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,916,268 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,906,371 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,315,000 | 1,365,601 | 1,327,818 | 2,879,591 | 1,315,000 | 1,684,462 | 1,243,659 | 2,841,808 |
| (ii) | කඩ කුලී | 4,519,050 | 5,121,628 | 5,556,153 | 3,521,187 | 4,480,800 | 4,306,724 | 3,634,526 | 3,955,712 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 970,000 | 1,018,450 | 1,017,750 | 406,385 | 950,000 | 607,722 | 607,722 | 405,685 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (iv) | වෙනත් ආදායම් ජල | 8,000,000 | 6,807,310 | 8,343,330 | 10,814,335 | 8,150,000 | 26,252,719 | 28,347,844 | 12,350,355 |
| | | ------------- | -------------- | ------------- | ------------- | -------------- | -------------- | -------------- | ------------- |
| | එකතුව | 14,804,050 | 14,312,989 | 16,245,051 | 17,621,498 | 14,895,800 | 32,851,627 | 33,833,751 | 19,553,560 |
| | | ======= | ======== | ======== | ======== | ======= | ======== | ======== | ======== |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එක් ඒකකයකින් රු.10,000 කට වඩා වැඩි හිඟ හිටි දේපල 30 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් ශේෂය රු.527,452 ක් විය. | හිග වරිපනම් ගාස්තුව අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබුණු දැන්වීම් පුවරු 21 කට අදාළ ව රු.30,600 ක ගාස්තු අයකරගෙන නොතිබුණි. | 2023 වර්ෂයට අදාළව දැන්වීම් පුවරු ගාස්තු ගෙවීම පිළිබඳව දැනුම් දීම් සිදුකර අයකිරීම් කටයුතු සිදුකරමින් පවතින බව. | ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 5 ක එකතුව රු.16,957,084 ක් විය. | ලැබියයුතු මුදල් අයකර ගැනිමට කටයුතු කරන බව. | ලැබියයුතු මුදල් අයකර ගැනිමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 03 ක එකතුව රු.17,516,186ක් විය. | ඉදිරියේදි ගෙවිමට කටයුතු කරන බව. | ගෙවියයුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකළ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාර පනතේ නියෝග / රෙගුලාසිවල 281 ප්‍රකාරව සංවර්ධන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ජල සම්පාදන මණ්ඩල විසින් ගොඩනැඟිල්ලක් හා ජල පවිත්‍රතාගාරයක් ඉදිකර තිබුණි. | නීත්‍යානුකුල කර, 2023 ගාස්තු සංශෝධනයට අනුව දඩ මුදල් අයකිරීමට කටයුතු කරන බව. | පනතේ නියෝග හා රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ කැබ් රථයක් අළුත්වැඩියා කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත යොමු කර රු.683,480 ක ඇස්තමේන්තුවක් ලබා ගෙන තිබුණද මහා සභා තීරණයකට අනුව නැවත ඇස්තමේන්තුවක් ලබා ගැනීමට මාස 08ක කාල ප්‍රමාදයක් ගතවීම හේතුවෙන් මිල වෙනස්වීම්වලට අනුව සභාවට රු.172,880 ක මූල්‍ය අලාභයක් දැරීමට සිදුව තිබුණි. | කමිටුවේ තීරණය මත ලබාගත් නව ඇස්තමේන්තුව සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනිමට යොමු කළ බව. | කාල පමාවකින් තොරව කාර්ය ඉටුකල යුතුය. |

3.3 **නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු බණ්ඩාරපොල ඊ නැණසල පරිගණක මධ්‍යස්ථානය 2019 ඔක්තෝබර් 25 දින සිට ක්‍රියාත්මක නොවීම නිසා එහි ඇති පරිගණක හා උපාංග හා කාර්යාල උපකරණ ඒකක 61 ක් නිෂ්ක්‍රීයව පැවතුණු අතර, වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර ද නොතිබුණි. | පරිගණක පුහුණුකරුවෙකු බඳවා ගැනීම සඳහා අනුමැතියට යොමුකර ඇති බව. | වත්කම් ඵලදායිව උපයෝජනය කළයුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු. 1,103,000 ක එකතුව පර්චස් 386.85 ක වපසරියක් සහිත ඉඩම් කොටස් 14 ක් හා වපසරිය හඳුනාගෙන නොතිබුණු රු. 200,000 ක ඉඩම් කොටසක වැට මායිම් සකස්කර ආරක්ෂාව තහවුරු කර නොතිබුණි. | කඩිනමින් ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කරන බව | දේපල වල ආරක්ෂාව තහවුරු කල යුතුය. |
| (ආ) | සභාව පරිහරණය කරන එකතුව රු.1,724,744 ක අක්කර 6 යි රූඩ් 1 පර්චස් 22 ක ඉඩම් කැබලි 12 ක් , ප්‍රමාණය හඳුනා නොගත් ඉඩම් 04 ක් හා රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හා පුද්ගලික හිමිකාරීත්වය යටතේ පවතින ඉඩම් 78 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ඉඩම්වල අයිතිය හඳුනාගෙන සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතුය. |

**3.5** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 13 ක පුරප්පාඩු 29 ක් ද එක් තනතුරකට අදාළව අතිරික්ත 3 ක් ද පැවතුණි. | පළාත් පාලන කොමසාරිස් විසින් බඳවා ගැනීම් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම තාවකාලිකව අත්හිටුවා ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනිමට කටයුතු කල යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**
**අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී වැය විෂයයන් 20 ක සියයට 45 සිට සියයට 100 දක්වා ද ආදායම් විෂයයන් 36 ක සියයට 45 සිට සියයට සියය ඉක්මවූ විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලක කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | 2024 වර්ෂයේ අයවැය කෙටුම්පත සකස් කරන අවස්ථාවේ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ආදායම් හා වියදම් නිවැරදිව පුරෝකථනය කර අයවැය පිළියෙල කළ යුතුය. |